(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 19.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2023 අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 - 2019 "යහපාලන රජය" සමයේ ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සිදු වූ බව දන්නේද;

(ii) එම වංචාව හේතුවෙන් සිදු වී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ලවී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

383/2023

ගරු නිතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ දුරකථන සමාගම්වලට අයත් සිම්කාඩ්පත් රජයේ නිසි නියාමනයකින් තොරව ප්‍රධාන නගරවල පදික වේදිකාවේ අලෙවි කරනු ලබන බවත්;

(ii) එම සිම්කාඩ්පත් වංචනික ලෙස විශාල වශයෙන් මිලට ගනු ලබන පුද්ගලයන් විසින් ඒවා අවභාවිතා කර විවිධ අක්‍රමිකතා සිදු කරනු ලබන බවත්;

(iii) අන්තර්ජාලය හරහා භාණ්ඩ ලබා දෙන බවට පොරොන්දු වී වංචනික ආකාරයෙන් බැංකු ගිණුම්වලට මුදල් බැර කර ගැනීමේ ජාවාරමක් සිදු කරනු ලබන බවත්;

(iv) මහනුවර, රත්නපුර, පිළියන්දල, බදුල්ල සහ කොළඹ ඇතුළු බොහෝ ප්‍රදේශවල තරුණයන් මේ වනවිට එම ජාවාරමෙහි ගොදුරක් බවට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත වංචා වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

419/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රූපවාහිනී නාලිකා සංඛ්‍යාව සහ ගුවන්විදුලි නාලිකා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රූපවාහිනී නාලිකා බලපත්‍ර කොන්දේසි සහ ගුවන්විදුලි නාලිකා බලපත්‍ර කොන්දේසි අතර විෂමතා පවතින බව පිළිගන්නේද;

(iv) එම විෂමතා ඉවත්කර ඒකමතිකභාවයක් ඇති කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

432/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන කිරිපිටිවල ඩීසීඩී මෙලමයින්, කෘතිම ලැක්ටෝස්, ඌරු තෙල්, ගව තෙල් හා මානව ශරීරයට අහිතකර වෙනත් රසායන ද්‍රව්‍ය අඩංගු බවට තහවුරු කර ගැනීම සඳහා රජය විසින් පරීක්ෂණ සිදු කර තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂණ සිදු කරනු ලබන ආයතනය/ආයතන කවරේද;

(iii) එම ආයතනය/ආයතන විසින් මේ දක්වා සිදු කරන ලද පරීක්ෂණවලට අදාළ වාර්තා ඉදිරිපත් කරන්නේද;

(iv) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය පහසුකම් එම ආයතනය/ආයතන සතුව තිබේද;

(v) නොඑසේ නම්, එම පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) සඳහන් රසායන ද්‍රව්‍ය අඩංගු බවට තහවුරු වී ඇති කිරිපිටි නිෂ්පාදනය කරනු ලබන ආයතනවලට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

688/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළුකාමම් ප්‍රාදේශීය රෝහල මේ දක්වා උත්ශ්‍රේණිගත කර ඇත්තේ DH - C ශ්‍රේණිය දක්වා පමණක් බව දන්නේද;

(ii) එසේ නම්, එම රෝහල DH -B හෝ A ශ්‍රේණියට උත්ශ්‍රේණිගත කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එම රෝහල DH -B හෝ A ශ්‍රේණියට උත්ශ්‍රේණිගත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහලේ ප්‍රසව ඒකකය සඳහා අවශ්‍ය උපකරණ (CTG machine, warmer) නොමැතිවීම හේතුවෙන් ගර්භනී කාන්තාවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

(ii) හදිසි ප්‍රතිකාර අංශය සඳහා අවශ්‍ය උපකරණ කිසිවක් රෝහලේ නොමැති බවත්,

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත රෝහල සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම උපකරණ ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

815/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මධ්‍යම රජයට හා පළාත් සභාවලට අයත් රෝහල් සංඛ්‍යාව එම රෝහල් වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල්වල දැඩි සත්කාර ඒකකවල ඇති ඇඳන් සංඛ්‍යාව හා සාමාන්‍ය වාට්ටුවල ඇති ඇඳන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි රෝහල්වල සේවය කරන මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාව, විශේෂඥ වෛද්‍යවරුන් සහ සාමාන්‍ය වෛද්‍යවරුන් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ රෝහල්වල භාවිතා කරනු ලබන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ වර්ග අතරින් මේ වනවිට හිඟ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට අවශ්‍ය ඖෂධ ආනයනය කිරීම සඳහා රජය විසින් වර්ෂයකට වැය කරනු ලබන මුදල රුපියල්වලින් හා ඇ.එ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

831/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 746-ඉදිරිලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ පාසල් මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ කළුතර කාර්යාලය විසින් සිදු කරන ලද බවත්;

(ii) ඒ අනුව පළමු අදියර ලෙස ඉහත මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරන ලද බවත්;

(iii) මේ වනවිට එම කොන්ක්‍රීට් ගල් වර්ෂා ජලයට ගසාගෙන යාම හේතුවෙන් එම මාර්ගය අබලන් වී ගමනාගමනය සඳහා නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත අ(iii) හි සඳහන් කරුණ හේතුවෙන් මුදල් අපතේ යාමක් සිදු වී තිබේ නම්, ඊට වගකිව යුතු පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

835/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 සිට මේ දක්වා හඳුනාගෙන ඇති, කොළඹ දිස්ත්‍රික්කයේ අධි අවදානම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින පවුල් අතරින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රමාදයක් පවතින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

847/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල් සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2931/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර ඉල්ලුම හා සැපයුම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති වීමෙන් බිත්තර මිල ඉහළ ගොස් ඇති බව දන්නේද;

(iii) බිත්තර මිල සාධාරණ මට්ටමකට පවත්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— දූෂණ විරෝධී,— දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ සහ වැරදි පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට, සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ වැරදි සහ ආශ්‍රිත වැරදි සඳහා නඩු පැවරීමට විධාන කිරීමට සහ නඩු පැවරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; දූෂණ ක්‍රියා වැළැක්වීම ප්‍රවර්ධනය ඉහළ නැංවීම සඳහා ද; දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාව අතර දැනුවත් බව ඉහළ නැංවීම සඳහා ද; (26 වන අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කිරීමට සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 ජනවාරි 17 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

3.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ආචාර්ය පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර මාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ වූ සැකසුම ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2023 අප්‍රේල් 26),— "අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0727/604/058-1 සඳහා වූ 2023 අප්‍රේල් 17 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩිනම් ප්‍රගතියක් ලබා ගැනීම සඳහා සහ වර්තමාන සහ අනාගත පරම්පරාවට ප්‍රයෝජනවත් වන තිරසර ආර්ථික වර්ධනයක් සඳහා, ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර එළැඹි SDR බිලියන 2.286 ක (ඇ.එ.ජ.ඩො. බිලියන 3.0 ක් පමණ) මාස 48 ක විස්තීරණ අරමුදල් පහසුකමේ සැකසුම, 2023 මාර්තු 22 දින සභාගත කරන ලද අතර, එම සැකසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම අනුමතිය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට ලබාදිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි."යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.04 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3)(අ) සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ඩ) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) සහ 117 (3) වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2ඇ, 5 සහ 5අ වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 08 දිනැති අංක 2292/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

13.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

රුහුණු උදානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

"මාතර සමය" සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40\.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41\.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***